# වැඩිහිටි නිවාස වල සිටින පුද්ගලයින්ගේ සමාජ ආර්ථික මානසික පසුබිම
## (ගම්පහ කිරිදිවැල රංවල ප්‍රදේශයේ සමාධි වැඩිහිටි නිවාසය ඇසුරිනි)

එම්.ඒ. රුෂාන්ති දිල්ෂානි[1]

## සංක්ෂේපය

මව්කුසින් මෙලොව එළිය දකිනා ඕනෑම පුද්ගලයෙකු ළමාවිය, තරුණවිය, මැදිවිය පසුකොට මහලුවිය කරා යෑම ලෝක ස්වභාවයයි. එම ලෝක ස්වභාවය සනාථ කරමින් මහලු විය කරා එළඹ සිටින්නාවූ බොහෝමයක් වර්තමාන සමාජය තුළ ව්‍යාප්තව පවතී. නමුත් සමාජය තුළ ඔවුන් පිළිබඳ කතිකාවතක් ගොඩ නැගී තිබීම දැකීම ඉතාමත් දුර්ලභය. බොහෝවිට ළමාවිය, තරුණවිය, මැදිවිය පිළිබඳ සමාජය තුළ පුළුල් වශයෙන් සාකච්ඡා වුවද හුදකලා මහලු විය පිළිබඳ විමර්ශනාත්මකව කෙරුණු පර්යේෂණ උගහටය. ඒ අනුව වැඩිහිටි නිවාසවල සිටින පුද්ගලයින්ගේ සමාජ, ආර්ථික,මානසික පසුබිම සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. අධ්‍යයනය සඳහා සමාධි වැඩිහිටි නිවාසය තෝරාගත් අතර එහි සිටින සියලුම වැඩිහිටියන් (26 දෙනෙකු) අධ්‍යයනය සඳහා භාවිතා කර ඇත. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් අවශ්‍ය දත්ත ලබාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විධික්‍රම භාවිතා කර ඇත. අධ්‍යයන නිගමනයන්ට අනුව බහුතරයක් වියපත් වුවත් හුදකලා බවට පත්ව ඇත්තේ ඔවුන්ගේම දරුවන්ගේ ක්‍රියා කලාපය මත බවද, බොහෝ දරුවන් විදෙස්ගත වීමේ හේතු සාධකය මත දෙමාපියන් වැඩිහිටි නිවාසයකට දමා ගොස් ඇති බවද අනාවරණය විය. එසේම බොහෝ වියපත් වුවන් ඔවුන්ගේ තරුණ වයස්වලදී සැලකිය යුතු රැකියාවල නියුතු වූවන්ද වන බව පෙනෙන්නට තිබුණි. බහුතරයක් වැඩිහිටි මව්පියන් විශ්‍රාම වැටුප් ලබන අය වීමද විශේෂයකි. ඔවුන්ගේ මානසික තත්ත්වය විමර්ශනය කිරීමේදී දරුවන් ඔවුන්ව පවුල් වලින් නෙරපා හැරීම සම්බන්ධයෙන් ඔවුන් තුළ වෛර සිතුවිල්ලක් නොමැති අතර නැවත ඔවුන්ට නිවසට යෑමට අවස්ථාවක් ලැබුනොත් යනවාද යන පැනයට ඔවුන්ගේ පිළිතුර වූයේ ඔවුන්ට මෙම ජීවිතය එනම් වැඩිහිටි නිවාසයේ ගෙවන ජීවිතය සුවදායක බවයි. එසේම එකිනෙකා අතර තිබූ අපූර්ව වූ සුහදත්වය සහ ඔවුන්ගේ ධර්මානුකූල චර්යාව ඔවුන් නැවත නිවස් කරා යෑමේ සිතුවිල්ලෙන් මුදවන බව ප්‍රත්‍යක්ෂ විය. වැඩිහිටි නිවාසය මඟින් මෙම වැඩිහිටියන්ට සිදුවන මෙහෙවර පිළිබඳ සොයා බැලීමේදී සැලකිය යුතු මට්ටමේ සුභදායක පිළිතුරක් ලැබිණි. පෝෂදායී ආහාර ඔවුන්ට දිනපතා ලැබුණු අතර ඔවුන් ආගමානුකූල දිවියකට පෙළඹවීමට පාලකයින් වගබලාගෙන තිබුනි. සෑදෑ සමය ගත කිරීම උදෙසා ද ඔවුන් යම් යම් ක්‍රියාකාරකම් වලට යොමු කරවා තිබුණි. තවද

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
rushanthidilshani@gmail.com

පොහෝ දා සිල් සමාදන් වීම වැනි කටයුතුද, ඔවුන් බැලීමට පැමිණෙන පිරිස් ද ඔවුන්ගේ මනස නිරවුල් කිරීමට බෙහෙවින් උපකාර කරන බවද තහවුරු විය. එසේම පර්යේෂණය අවසානයේ දැනගත හැකි තවත් කරුණක් වූයේ වැඩි වශයෙන් හුදකලා බවට පත්වී ඇත්තේ කාන්තාවන් වන බවත් තම පුතුගේ විවාහයෙන් පසු ඔවුන්ට එම තත්ත්වය උදා වී ඇති බවත්ය.

**මුඛ්‍ය පද :** *වැඩිහිටියන්, වැඩිහිටි නිවාසය, සමාජ ආර්ථික මානසික පසුබිම*